අද
සිකුරාදා
2014-10-17

# 'මාලබේ වෛද්‍ය විද්‍යාලය හොර උපාධි කඩයක්' යැයි කීවාට කෝටි 05 ක වන්දි ඉල්ලයි

**- මාලබේ වෛද්‍ය විද්‍යාලයේ දෙමාපිය සංගමය**



■ **අමිත් මධුරංග**

මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය 'හොර උපාධි කඩය' ලෙසින් පුවත්පත්වලට ප්‍රකාශ කරමින් එහි ඉගෙනගන්නා සිසුන්ට අපහාසයක් කර ඇතැයි සඳහන් කරමින් සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට එරෙහිව නඩු පවරා කෝටි පහක වන්දියක් ලබාගැනීමට මාලබේ වෛද්‍ය විද්‍යාලයීය දෙමාපිය සංසදය සූදානම් වෙයි.

එම සංසදයේ කැඳවුම්කරු ගැමුණු

p 04

# උසස්වීම් වෛද්‍ය සභාවේ ලියාපදිංචි අයට පමණයි

## මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ දරුවන් යථාර්ථය තේරුම් ගතයුතුයි

**- රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය**

■ **ඉන්දික හේවාවිතාරණ**

රජයේ වෛද්‍යවරුන් වෙනුවෙන් සකස්කර තිබෙන නව සේවා ව්‍යවස්ථාවට අනුව උසස්වීම් හිමිවන්නේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වන වෛද්‍යවරුන්ට පමණක් බැවින් දැන්වත් යථාර්ථය තේරුම් ගන්නා ලෙස රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුවන්ගෙන් ඉල්ලා සිටියි.

p 04

### 'මාලබේ වෛද්‍ය විද්‍යාලය ...

p 01

විජේරත්න මහතා සඳහන් කළේ ලබන සතිය ඇතුළත නඩු පවරන බවට නීතිඥයන් මාර්ගයෙන් අදාළ සංගමයේ ලේකම්වරයාට ලිපියක් මගින් දන්වා ඇති බවයි. හොර උපාධි කඩයක්ද, නැද්ද යන්න පිළිබඳව එම සංගමයට එක එල්ලේ පැවසිය නොහැකි බව පැවසූ විජේරත්න මහතා මේ නිසා එම වෛද්‍ය විද්‍යාලයේ ඉගෙනගන්නා සිසුන් අපහසුතාවට පත්ව ඇතැයි සඳහන් කළේය. මේ අතර මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පවත්වාගෙන යාමේ වැදගත්කම පැහැදිලි කිරීමට ලබන සතියේ ත්‍රෛනිකායික මහනායක හිමිවරුන් හා මැල්කම් රංජිත් අගරදගුරුතුමා මුණගැසීමටද එම දෙමාපිය සංසදය අදහස් කරගෙන සිටියි. ගැමුණු විජේරත්න මහතා සඳහන් කළේ ඊට අමතරව මහජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකාද මුද්‍රණය කර ඇති බවයි. එසේම ලබන සතියේ සිට ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකරමින් ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකරන බවද ඔහු කීය.

### උසස්වීම් ...

01

ඊයේ (16දා) පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී මේ බව සඳහන් කළ එම සංගමයේ උපලේකම් වෛද්‍ය නවීන්ද සොයිසා මහතා වැඩිදුරටත් සඳහන් කළේ වෛද්‍ය සභාව යනු වෛද්‍ය සේවාවේ උත්තරීතරම ස්ථානය බවත්, එහි අනුමැතියක් නොමැති කිසිදු ආයතනයකට තම සායනික පුහුණුව ලබාගැනීමට රජයේ රෝහල් ලබානොදෙන බවට තවත් වරක් තහවුරු කර කියන බවත්ය.

ඊට අමතරව කුමන හෝ ක්‍රමයකින් මෙම ආයතනයට වර්තමානයේදී වෛද්‍ය සභාවේ අවසරය ලැබුණද අදාළ අවසරය ක්‍රියාත්මක වන්නේ ඉදිරියට නිසා දැනට පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වී සිටින 900 දෙනාට ඒ යටතේ වෛද්‍යවරයෙකු ලෙස ලියාපදිංචි විය නොහැකි බවද ඔහු සඳහන් කළේය.

මේ නිසා දැනට එම ස්ථානයේ ඉගෙනුම ලබන සියලු දෙනා රැවටීමකට ලක්ව තිබෙන බව තේරුම්ගන්නා ලෙසත්, අදාළ ස්ථානය පිළිබඳව මේ වනවිට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නිහඬව සිටියද සායනික පුහුණුව ලබාගැනීමට රජයේ රෝහල්වලට පැමිණියහොත් එදිනට ගතයුතු සියලු ක්‍රියාමාර්ග ගන්නා බවත් වෛද්‍ය නවීන්ද සොයිසා මහතා පවසා සිටියේය.

රජයේ වෛද්‍ය නිලධාරීන් වෙනුවෙන් 6/2006 වැටුප් චක්‍රලේඛයට අනුව සකස්කළ නව සේවා ව්‍යවස්ථාව මගින් ප්‍රමිතියකින් තොර සහ වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නොලැබෙන වෛද්‍යවරුන් රාජ්‍ය සේවයට එක්වීම වළකා තිබෙන බවද හෙතෙම සඳහන් කළේය.